දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ..............................

දිනය / திகதி / Date: 2014.04. [illegible]

චක්‍රලේඛ අංක : 12/2014

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

## කෘෂි විද්‍යාව දැනුම මිනුම තරගය - 2014

කෘෂි හා ආහාර තාක්ෂණය විෂයයක් ලෙස හදාරන 2014 වර්ෂයේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන එනම්, පළමුවරට අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටින සිසුන්ගේ න්‍යායික දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කිරීම පිණිස දැනුම මිනුම තරගයක් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව සැලසුම් කර ඇත. ඒ අනුව එම තරගය කොට්ඨාස, කලාප, පළාත් හා ජාතික මට්ටම්වලින් පැවැත්වෙනු ඇත.

### 01. අභිමතාර්ථ

- සිසුන්ට න්‍යායික දැනුම හා ප්‍රායෝගික කුසලතා ලබා ගැනීමට අවස්ථාව සැලසීම
- අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම
- අ.පො.ස (උ.පෙළ) කෘෂි විද්‍යාව විෂයය සඳහා වැඩි සිසුන් සංඛ්‍යාවක් යොමු කිරීම
- කෘෂිකාර්මික කටයුතු සඳහා ඵලදායි හා තිරසාර ලෙස සම්පත් භාවිතයට යොමු වීම
- කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති ව්‍යවසායකත්ව මාර්ග හඳුනා ගැනීමට අවස්ථාව සැලසීම
- පරිසර හිතකාමී ලෙස කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට අවස්ථාව සැලසීම

### 02. කාල වකවානු

| | |
|---|---|
| කොට්ඨාස මට්ටමේ තරගය | - මැයි 15ට පෙර පැවැත්විය යුතු ය. |
| කලාප මට්ටමේ තරගය | - ජූනි 15ට පෙර පැවැත්විය යුතු ය. |
| පළාත් මට්ටමේ තරගය | - අගෝස්තු 10ට පෙර පැවැත්විය යුතු ය. |
| ජාතික මට්ටමේ තරගය | - සැප්තැම්බර් 30ට පෙර පැවැත්විය යුතු ය. |

### 03. තරග පැවැත්වීම - පොදු උපදෙස්

මෙම තරගය සඳහා ඉදිරිපත් විය හැක්කේ අදාළ වර්ෂයේ 11 ශ්‍රේණියේ කෘෂි හා ආහාර තාක්ෂණය විෂයය හදාරන සිසු සිසුවියන්ට පමණි. සෑම තරගයක් ම ආරම්භයට පෙර මෙහි අභිමතාර්ථ, කොන්දේසි හා ලකුණු ක්‍රමය සිසුන්ට පැහැදිලි කර දිය යුතු ය. තරගය සම්බන්ධයෙන් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

3.1 තරග මට්ටම්

- කොට්ඨාස මට්ටම
- කලාප මට්ටම
- පළාත් මට්ටම
- ජාතික මට්ටම

## 3.2 තරග සංවිධානයේ දී ඒ ඒ මට්ටම සඳහා විශේෂ උපදෙස්

### 3.2.1 කොට්ඨාස මට්ටමේ තරග (මැයි 15ට පෙර)

පළමු වාර පරීක්ෂණයේ ලබා ගත් ලකුණු අනුව පාසල්වල ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාවට අනුපාතිකව වැඩි ම ලකුණු ලබාගත් සිසුන් අතරින් පහත වගුවේ දැක්වෙන ආකාරයට කොට්ඨාස මට්ටමේ තරග සඳහා සිසුන් තෝරා ගත යුතු ය.

| කෘෂි හා ආහාර තාක්ෂණය ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව | කොට්ඨාස මට්ටමේ තරග සඳහා තෝරා ගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 0-10 | 1 |
| 11-20 | 2 |
| 21-30 | 3 |
| 31-40 | 4 |
| 41-50 | 5 |
| 51 ට වැඩි | 6 (උපරිම) |

මෙසේ තෝරා ගන්නා සිසුන් සඳහා කලාප මට්ටමින් සකස් කරන ලිඛිත පරීක්ෂණයක් ඇසුරින් කලාපයට අයත් සෑම කොට්ඨාසයක ම එක ම දිනයක දී එක ම වේලාවක දී පරීක්ෂණය පැවැත්විය යුතුය. එම පරීක්ෂණයේ දී සිසුන් විසින් ලබා ගන්නා ලකුණුවලට අනුව වැඩි ම ලකුණු ලබාගන්නා සිසුන් 05 දෙනෙකු තෝරා කලාප මට්ටම සඳහා යොමු කළ යුතු ය. තෝරා ගත් සිසුන්ගේ පිළිතුරු පත්‍රය ද ලකුණු සමඟ ම අමුණා යැවිය යුතු ය.

මෙහිදී සම ලකුණු ලැබූවන් සිටීම මත තෝරා ගත යුතු සංඛ්‍යාව 5ට වැඩි වන විට දී සුදුසු ක්‍රමවේදයක් යොදා ගෙන 05 දෙනෙකු පමණක් තෝරා ගැනීම කලාපයේ විෂය භාර අධ්‍යක්ෂවරයාගේ වගකීමකි.

### 3.2.2 කලාප මට්ටමේ තරගය (ජුනි 15 ට පෙර)

කලාප මට්ටමේ තරගය සඳහා ස්ථානීය පරීක්ෂණයක් (SPOT TEST) පවත්වනු ලැබේ. කලාප මට්ටමේ ජයග්‍රාහකයින් තේරීමේ දී කොට්ඨාස මට්ටමේ දී ලබා ගත් ලිඛිත පරීක්ෂණයේ ලකුණු සහ කලාප මට්ටමේ ස්ථානීය පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු එකතු කළ යුතු ය. එමගින් පිළියෙල කරන ලකුණු ලැයිස්තුවට අනුව වැඩි ම ලකුණු ලබාගත් සිසුන් 5 පළාත් මට්ටමේ තරගය සඳහා යොමු කළ යුතු ය.

ස්ථානීය පරීක්ෂණය සඳහා යොදා ගත යුතු ස්ථාන (SPOTS) සංඛ්‍යාව 25 කි.

### 3.2.3 පළාත් මට්ටමේ තරගය ( අගෝස්තු 10ට පෙර)

එක් කලාපයකින් සිසුන් 5 බැගින් කලාප සංඛ්‍යාවට අනුකූල තරගකරුවන් සංඛ්‍යාවක් පළාත් තරගය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

පළාත් මට්ටමේ තරගය ලිඛිත පරීක්ෂණයක් හා ස්ථානීය පරීක්ෂණයක් යන දෙකෙන් ම සමන්විත ය.

පළාතේ තෝරාගත් එක් ස්ථානයක දී , එකම දිනයක දී ලිඛිත පරීක්ෂණය හා ස්ථානීය පරීක්ෂණය පැවැත්විය යුතු ය.

එම තරග දෙකෙන් ලබා ගන්නා ලකුණුවල එකතුව අනුව වැඩි ම ලකුණු ලබා ගන්නා සිසුන් 5 දෙනා ජාතික මට්ටම සඳහා යොමු කළ යුතු ය.

### 3.2.4 ජාතික මට්ටමේ තරගය (සැප්තැම්බර් 30ට පෙර)

ජාතික මට්ටමේ තරගය ලිඛිත පරීක්ෂණයකින් හා ස්ථානීය පරීක්ෂණයකින් සමන්විත වේ. ඒ අනුව වැඩි ම ලකුණු ලබාගන්නා සිසුන් සඳහා ජාතික මට්ටමේ ජයග්‍රහණ පිරිනමනු ලැබේ.

### 3.3 ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

10 හා 11 ශ්‍රේණිවල කෘෂි හා ආහාර තාක්ෂණය විෂය නිර්දේශයට හා කෘෂිකර්මයට අදාළ සාමාන්‍ය දැනීම ඇතුළත් නිශ්චිත කෙටි පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්න පත්‍රයකි.කොට්ඨාස, පළාත් හා ජාතික මට්ටම්වල දී දෙනු ලබන ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 01 මිනිත්තු 15 ක් වන අතර ප්‍රශ්න සංඛ්‍යාව 50ක් විය යුතු ය.

### 3.3.1. ස්ථානීය පරීක්ෂණය

ස්ථානීය පරීක්ෂණය යනු කෘෂි විද්‍යාව 10 හා 11 ශ්‍රේණිවල විෂය නිර්දේශයට අදාළ ව සකස් කරන ලද නිදර්ශක (ජීවී හා අජීවී) වෙන් වෙන් ව පංති කාමරයක් තුළ ස්ථාන ගත කර ඊට අදාළ ප්‍රශ්න එම ස්ථානවල වෙන් වෙන් ව ප්‍රදර්ශනය කර තරගය අවස්ථාවේ දී නිශ්චිත කාලයක් තුළ සිසුන් ඒ සඳහා යොමු කරවීමයි. මෙහි මූලික අරමුණ කෘෂි විද්‍යා විෂය නිර්දේශයට අදාළ ප්‍රායෝගික කුසලතා සිසුන් විසින් අත්පත් කර ගෙන ඇත් දැයි පරීක්ෂා කිරීමයි. එම නිසා නියමිත කාලය තුළ නිදර්ශක ඇසුරින් නිශ්චිත පිළිතුරු සැපයිය හැකි ලෙස ප්‍රශ්න සැකසීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

- මෙම පරීක්ෂණය පවත්වනු ලබන්නේ කලාප, පළාත් හා ජාතික මට්ටම්වල දී පමණි.
- ස්ථානීය පරීක්ෂණය සඳහා ස්ථාන 25කට නිදර්ශක සැලසුම් කළ යුතු ය. (එනම් ස්ථානීය පරීක්ෂණය සඳහා උප කොටස් සහිත ව/ රහිත ව සම්පූර්ණ ප්‍රශ්න 25ක් සැකසිය යුතු ය.
- ස්ථානීය පරීක්ෂණයේ එක් ස්ථානයක් සඳහා වෙන් කරන කාලය මිනිත්තු 2කි.
  (ස්ථානීය පරීක්ෂණය සඳහා මූලාකෘති ප්‍රශ්න කිහිපයක් ඇමුණුමේ දක්වා ඇත.)

### 3.3.2 භාෂා මාධ්‍යය

සිංහල හා දෙමළ මාධ්‍ය දෙක සඳහා වෙන් වෙන් වශයෙන් තරග නොපැවැත්විය යුතු ය. සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පිළියෙල කරනු ලබන ප්‍රශ්න පත්‍රය දෙමළ හෝ සිංහල මාධ්‍යයට පරිවර්තනය කර සිංහල හා දෙමළ මාධ්‍ය තරග එක ම දිනයේ එක ම වේලාවක දී පැවැත්විය යුතු ය.

ස්ථානීය පරීක්ෂණයේ දී භාෂා දෙකෙන් ම ප්‍රශ්න ඉදිරිපත් කළ යුතු අතර අවසානයේ වැඩි ම ලකුණු ලබාගන්නා සිසුන් 05 දෙනා තෝරාගනු යුත්තේ භාෂා මාධ්‍යය නොසලකා හැර, ලබා ගත් ලකුණු පදනම් කරගෙන ය.

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ඇමුණුම 01

ස්ථානීය පරීක්ෂණය සඳහා ආදර්ශ ප්‍රශ්න

(01) පහත සඳහන් නිදර්ශක A, B, C ලෙස නම් කර තබන්න.

A - ගුටි ලේයරයක් සිදු කරන ලද ශාකයක්

B - රිකිලි බද්ධයක් සිදු කරන ලද ශාකයක්

C - අංකුර බද්ධයක් සිදු කරන ලද ශාකයක්

(i) A, B, හා C යන ශාක ප්‍රචාරණ ක්‍රම තුන නම් කරන්න (ලකුණු 1/2 × 3)

(ii) A නිදර්ශකයේ ඇති ශාකයට අමතරව මෙම ක්‍රමයට ප්‍රචාරණය කළ හැකි වෙනත් ශාකයක් නම් කරන්න (ලකුණු 1/2)

(02) නිදර්ශක ලෙස පහත සඳහන් දෑ තබන්න.

| A - කෘමි පළිබෝධයක් | B - වල් පැළෑටියක් | C - රෝගී ශාක නිදර්ශකයක් |
|---|---|---|
| උදා : ඉල් මැස්සා | උදා : ඇටවරා | උදා : විචිත්‍ර වෛරස් රෝගය |
| පිටි මකුණා | කලාදුරු | දියමලන් කෑම |
| අවුලකපෝරා ආදිය | | හිටු මැරීම ආදිය |

(i) A, B, හා C හඳුනා ගෙන නම් කරන්න (ලකුණු 1/2 × 3 = 1 1/2)

(ii) A කෘමියා හානි කරන බෝගයක් නම් කරන්න (ලකුණු 1/2)

(03) රැග්ඩෝල් ක්‍රමයට අනුව නිවැරදි ලෙස හා වැරදි ලෙස සකස් කළ ඇටවුම් 2ක් නිදර්ශක ලෙස තබන්න. ඒවා A හා B ලෙස නම් කරන්න.




A B

(I) මෙම ඇටවුම් සකස් කරනුයේ කුමක් පරීක්ෂා කිරීම සඳහා ද? (ලකුණු 01)

(II) A හා B ඇටවුම් දෙක අතරින් වැරදි ආකාරයට සකස් කර ඇත්තේ කුමක් ද? (ලකුණු ½)

(III) එහි ඇති දෝෂය කුමක් ද? ((ලකුණු ½)